# රැකීමු පණ මෙන් පරිසරය



ජේ. ධනුෂි කාවින්ද්‍යා

# රකිමු පණ මෙන් පරිසරය

ජේ. ධනුෂි කාවින්ද්‍යා

ප්‍රථම මුද්‍රණය : 2023

කර්තෘ : ජේ. ධනුෂි කාවින්ද්‍යා

ලිපිනය : නො: 84, මීකණුව පාර,
තැන්නේකුඹුර පාර,
මහනුවර.

ISBN අංකය : 978 -624 -206 -849 -7

මුද්‍රණය
"PRESS"
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර

# පිදුම

ලොවක් දිනන්නට ලොවක් තනන්නට

දැනුමෙන් දහමෙන් පෝෂණය කරන්නට

නිරතුරුවම වෙහෙස වන්නා වූ

මාගේ ආදරණීය විදුහල්පතිතුමිය,

පන්තිභාර ගුරුතුමිය ඇතුළු ගුරු මව්පියන්ටත්,

මා ආදරයෙන් රැකගන්නා පෝෂණය කරන

මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,

මා වැනිම දැනුම සොයන

මාගේ සොයුර සොයුරියන්ටත්

මේ පොත ආදරයෙන් පුද කරමි!

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01

පරිසරය කියන්නේ අප වටා තිබෙන සියලු දේවල්වලට ය. අව්ව, වැස්ස, සුළඟ, ගහ කොළ, සතා සීපාවා, ඇළ දොළ මේ සියල්ල පරිසරයට අයිතිය. පරිසරය නැතිව කිසිම සතෙකුට ජීවත්විය නොහැකියි. අප හැම දෙනාටම ජීවත් වීමට පරිසරය උදව් වෙනවා.



පරිසරයේ ඇති ගහ කොළ අපට ඔක්සිජන් ලබා දෙනවා. අප මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ගහකොළ උරාගන්න නිසා පරිසරය පිරිසිදු වෙනවා.



පරිසරයේ ඇති ශාක වර්ග මිනිසාට ජීවත්වීමට උදව් වෙනවා.



ගස්වැල් හා ඒවායේ ශාක පත්‍ර ගඩා ගෙඩි මිනිසාට ආහාර වශයෙන් ලබා දෙනවා. පරිසරයේ ඇති ශාක වර්ග මිනිසාගේ ආහාරයටත්, ඖෂධ වශයෙනුත් ගනු ලබනවා.



පරිසරයේ ඇති ස්වාභාවික දිය උල්පත්, ගංගා, ඇළ-දොළ ආදියේ ජලය මිනිසාගේ සියලු අවශ්‍යතා සපුරාලයි.

පරිසරය පිරිසිදු වූ තරමට අපට ජීවත් වීමේ පහසුව උදාවෙනවා.



පරිසරය අපිරිසිදු වන විට මිනිසාට ජීවත් වීමට විවිධ බාධා දුක් කරදර ඇති වෙනවා.

පරිසරයේ අපිරිසිදු බව, වාතය අපිරිසිදු වීමටත්, විවිධ ලෙඩරෝග ඇති වීමටත් හේතු වෙනවා.



වැසි ජලය එකතු වීමට උපකාර වන ටිං, ටයර්, තැඹිලි කෝම්බ, යෝගට් කප් වැනි දේවල් පරිසරයට විසිකිරීමෙන් ඩෙංගු මදුරුවන් ඇති වෙනවා.



ඩෙංගු මදුරුවන් දෂ්ඨ කිරීමෙන් ඩෙංගු උණ සෑදී මරණයට පවා පත් වේ.

ඒ නිසා පරිසරයේ අපිරිසිදු බව මිනිසාගේ ජීවිතයට තර්ජනයකි.



මී උණ ඇති වීමටද පරිසරයේ අපිරිසිදු බව හේතු වෙනවා.

ඒ නිසා අපි ජීවත්වන පරිසරයේ ගස්කොළන්, ශාක වර්ග අපේ ජීවත්වීමට හේතු වන අතර ඒවා ආරක්ෂා කරගෙන පිරිසිදුව තබා ගැනීමෙන් පරිසරය අපේ නිවහනක් කරගනිමු.



ගස් කපා විනාශ නොකර ගස්, වැල් අපේ පණ මෙන් රැකගනිමු.



එවිට පරිසරයේ සුන්දරත්වය මෙන්ම එය අපේ නීරෝගිමත් ජීවිතයකට ද බෙහෙවින් ම උපකාරී වනු නිසැකය.

එමනිසා පරිසරය අපගේ පණ මෙන් රැක ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01